# සුභාෂිතයෙන්



## වි ක ධර්මබන්ධු

*සසොබන මහතුනට වත් නොමඳ ගරුතර*
*දින දින පුරුදු වීමෙන් කෙරෙති අනදර*
*නොමදින සුවඳ විහිදෙන සොඳ සඳුන් හර*
*හිමවත වසන වැදි අඟනෝ කෙරෙති දර*

**ගැදි කවිය :**
නොමඳ ගරුතර
සසොබන මහතුනටවත්
දින දින පුරුදු වීමෙන්
අනදර කෙරෙති
නොමඳින සුවඳ විහිදෙන
සොඳ සඳුන් හර
හිමවත වසන වැදි අඟ නෝ
දර කෙරෙති.

**තේරුම :**
අතිශයින් ගරුතර වූ - ඉතා යහපත් මහතුන් හට වුවත් - දිනපතා පුරුදු වීම නිසා හිරිහැර - ගැහැට කෙරෙති. (එය හරියට) බොහෝ සුවඳ ඇති - සඳුන් අරටු - හිමාල වනයේ වෙසෙන වැදි ගෑනු දරට ගන්නාක් මෙනි. (හිමාල වනයේ වැදි ගෑනු සඳුන් ලී දරට ගන්නාක් මෙන් දුදනෝ උතුමන් හට වුවත් ගැහැට කෙරෙති) මෙහි හිමාල වනයේ වැදි ගෑනු දුදනන් හැටියටත් සඳුන් අරටු උතුමන් හැටියටත් සිතා ගත යුතුය.

පියකරු-ලස්සන යන තේරුම දෙන "සොබන" යන පදයට "ස" එක් කොට "සසොබන" හදාගෙන ඇතත් තේරුම එක ම ය. විරිත රැකීම සඳහා (වුවමනාවක් නැතත්) ඉ - ස - සු ඈඳා ගැනීම කිවියන්ගේ සිරිතයි. අපට නිතර ඇසෙන පෙනෙන "සුපුරුදු, සුකොමල, සුමිහිරි, සුභාෂිත, සුභාවිත යන වචන සමහර තැනක යෙදෙන්නේ තේරුමක් ඇති ව ම නොවේ.

විදින්නේ විදි-වැදි වී ඇතැයි කියති. හිමාල වනයේ වැද්දන් සිටි බවක් - (මනමේ කතාවේ වැදි රජුගේ කතාව හැර) මම නොදනිමි.

අනුන්ට කරදරයක්-බරක් වීම හැදුනු මිනිසුන් ගේ සිරිත නො වේ. තමන්ගේ බල්ලා-බළලා-හරකා-එළුවා-ඌරා පවා අනුන්ට කරදරයක් නොවිය යුතුය. අප බොහෝ දෙනා පුරුදු වී-හැඩ ගැසී ඇත්තේ එහි අනෙක් පැත්තටය. තමන් ගැන මිස අනුන් ගැන නොසිතන්නා මේ කියන විදියට දුදනෙකි. ඔහුට මහතුනුත් නොමහතුනුත් එක ය.

අද අපට හිමාලය යනු අයිස් පව්වක් වුවත් එදා තව්සන් හිමාල වනයේ විසූ බව කියති. ගිහි ගෙය ගිනි ගෙයක් සේ දැනුනු නිසා, ඔවුන් සීතල හිමාලයට ගියා විය යුතුය.

මහතුන්ට යන්න මහතුනට වී ඇත්තේ න/ණ-ල/ළ බේදය රැකීම නිසාය. (මහතා - ට, මහතකු - ට) මහතුන්-ට යන්න මහතුනට වන්නේ "න්" අකුරට පරව ට-ඩ අකුරු යෙදීම වැරදි බව කියන නිසා ය. එක්කෝ "මහතුණ්ට" විය යුතුය. එසේ නොකරන්නේ නම් "මහතුනට" විය යුතුය. "න" යන්න "ණ" කිරීමට හෝ "ණ" යන්න "න" කිරීමට රීතියක් ගැන මම නොදනිමි. අපේ උගතුන් පවා පැරැණි/පැරැන්නා, අරුණු එළිය/අරුණාලු මෙන් ම ලින්ටන්, පැන්ඩා ද, ලියන සැටි ඔබ දැක ඇත. මේ කවියේ උක්තයක් නැත. ඊට ගැලපෙන උක්තය අප සොයා ගත යුතුය.







ජයන්තා ආනන්දප්පා
(සිඩ්නි නුවර)

"සමනල සංධ්වනිය" සම්භාව්‍ය සිනමා සිතුවමක් ලෙස බොහෝ දෙනා එක හෙලා පිළිගෙන ඇත්තාක් සේ පෙනේ. චිත්‍රපටයේ දුබලතා බොහෝ උදවියට නොපෙනෙනා සේය එසේත් නැත්නම් දුබලතා ගැන කතා කිරීමට කිසිවකුටවුද උවමනාවක් නැත්තාක් සේය.

"සමනල සංධ්වනිය"ද ඇතුළු අද බිහිවන අනෙකුත් චිත්‍රපට විධිමත් නිසි විචාරයකට ලක් නොවීමට එක් මූලික හේතුවක් වනුයේ කලාත්මක නිර්මාණයක හොඳ නරක තෝරා බේරා ගැනීමට අවැසි විචාර බුද්ධිය හා සංයමය බොහෝ දෙනෙකු තුල නොමැති වීමය. කලාවට කිසිසේත් හිතකර නොවන අද පවතින රුදුරු වාණිජමය සමාජ වාතාවරණය හා සියලුම සම්භාවනීය කලාවන්ගෙන් මිනිසුන් ක්‍රමයෙන් ඈත්වීම මෙයට ප්‍රධාන හේතුව ලෙස දැක්විය හැකිය. විචාරයට අදාළ මූලික සිද්ධාන්ත හෝ සිනමා විචාරයට ඇවැසි මිනුම් දඬු හෝ පිලිබඳ දළ අදහසකුදු අද බොහෝ දෙනකු තුල - බොහෝ විචාරකයන් තුල පවා නොමැති තරම්ය. රූපවාහිනී නාලිකා අරක් ගත් මෙගා හා සීනි බෝල ටෙලි නාට්‍ය වලට වඩා හරවත් ගැඹුරු නිර්මාණ දැක නොමැති සම්භාව්‍ය සිනමාව යනු කුමක්දැයි සිහිනෙනුදුවත් නොදත් බහුතරය ප්‍රචාරයට මුලාවී "සමනල සංධ්වනිය" අති ශ්‍රේෂ්ට නිර්මාණයක් ලෙස දැකීමත් සැලකීමත් එක් අතකින් පුදුමයට හෝ අරුමයට හේතු විය යුතු නැත.

අද පවතින උග්‍ර ජීවන අරගලය හෝ සමාජ යතාර්ථය වැනි විෂයන් ප්‍රස්තුත කොට ඒවා සියුම් හෝ නිර්ධය හෝ නිරීක්ෂණයට හසු කරමින් සිනමා නිර්මාණයෙහි යෙදීමට දැනට පවතින දේශපාලන වාතාවරණය තුල සිනමා කරුවන්ට අවකාශයක් නැති සේය. නිපුණතා ඇත්තන්ටද බාහිර බලපෑම් නිසා අද පවතින සමාජ ප්‍රශ්ණ තම කලා නිර්මාණවල මුලාශ්‍ර ලෙස යොදා ගැනීමට අවශ්‍යතාවක් නොමැති සේය. අබා මහින්දාගමනය කුස පබා හා සිරි පැරකුම් වැනි චිත්‍රපට බිහි වන්නේත් එවැනි චිත්‍රපට වලට රාජ්‍ය අනුග්‍රහය ලැබෙන්නෙත් මෙවැනි පසුබිමකය. රාජ තන්ත්‍රයට කඩේ යාමට වඩා ගැඹුරු දෙයක් මෙවැනි චිත්‍රපට වලින් සිදු නොවෙයි. හඳගම වැනි පිළිගත් විශිෂ්ට සිනමා කරුවන් පවා වල්මත් වී බොලිවුඩ් ගණයට නෑකම් කියන විදු වැනි චිත්‍රපට බිහි කරන්නේද ප්‍රසන්න විතානගේ වැන්නවුන් උවමනාවෙන්ම දියාරු කල ආකාස කුසුම් වැනි නිර්මාණ ඉදිරිපත් කරන්නේ ද මේ වාතාවරණය තුලය. සිනමාත්මක ගුණයන් විසින් සුළඟ එනු පිණිස හා ඉර මැදියම නිර්මාණයනට නෑකම් කියන මාළුවෝ ඉගිල්ලෙති යන චිත්‍රපටය ආරක්ෂක අමාත්‍යංශයේ උදහසට ලක්වෙමින් වාරණය වන්නේ ද මෙම වාතාවරණය තුලය. රාජ තන්ත්‍රයට හෝ යුධමය ජයග්‍රහණයෙහි උද්දාමයට හෝ එරෙහිව වචනයකුදු නොඉවසන මෙවැනි යුගයක චන්ද්‍රසිරි වැන්නකු සමනල සංධ්විනිය වැනි අමුතු මාදිලියේ චිත්‍රපටයක් ඉදිරිපත් කිරීම එක් අතකින් පුදුම විය යුතු නැත.

ජයන්ත චන්ද්‍රසිරි යනු සිනමා තාක්ෂණය මැනවින් ප්‍රගුණ කළ ප්‍රතිභා ශක්තියෙන් හීන නොවූ දක්ෂ සිනමා කරුවෙකු වුවද ශිල්පීය නිපුනතාව හා ශිල්පීය ශාක්‍යතා පමණක් සම්භාවනීය සිනමා කෘතියක් බිහිකිරීමට ප්‍රමාණවත් නොවන බව අමුතුවෙන්